WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**45 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

| | | |
|---|---|---|
| භරත නැටුම් | I, II | පැය තුනයි |
| பரதநாட்டியம் | I, II | மூன்று மணித்தியாலம் |
| Bharatha Dancing | I, II | *Three hours* |

## භරත නැටුම් I

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

**1.** තම සිරුර මලක් සේ සලකා එය දෙවියන්ට කැප කරන්නාක් සේ සකස් කර ඇති භරත නාට්‍ය උරුප්පඩිය,
(1) වර්ණම් ය. (2) ජතීස්වරම් ය. (3) අලාරිප්පු ය. (4) තිල්ලානා ය.

**2.** 'වේණු' යනුවෙන් උත්තර භාරතීය භාෂාවකින් හඳුන්වන සංගීත භාණ්ඩය වනුයේ,
(1) නාදස්වරම් ය. (2) බටනළාව ය. (3) දවුල ය. (4) මිරුතංගම් ය.

**3.** $1_3\ 0\ 1_3$ යන තාලය,
(1) මිශ්‍ර ජාති ජම්බයි තාලම් ය.
(2) තිස්ර ජාති තුරුව තාලම් ය.
(3) සතුස්ර ජාති තිරිපුඩයි තාලම් ය.
(4) තිස්ර ජාති මට්ටිය තාලම් ය.

**4.** පාත්තිර ප්‍රාණනයෙහි 'ස්ථිරත්වය' යන්න,
(1) උනන්දුවයි. (2) ඇඩි බවයි. (3) ගැයීමේ හැකියාවයි. (4) වේගයයි.

**5.** ශාස්ත්‍රීය නැටුම හා ගැමි නැටුම වෙන් කර දක්වන වැදගත් අංගය,
(1) වේදිකාවයි.
(2) පසුබිම් වාදනයයි.
(3) ඇඳුම් නිරූපණයයි.
(4) හඬ හා ආලෝකකරණයයි.

**6.** 'කුම්මියේ' විශේෂත්වය,
(1) අත්පොළසන් දීම ය.
(2) කෝටුවලින් තට්ටු කිරීම ය.
(3) ලේන්සුව සෙලවීම ය.
(4) මල් තබාගෙන සිටීම ය.

**7.** කුඩයිවරයි කෝවිල නිර්මාණය කළ කාලවකවානුව,
(1) චෝළ යුගයයි.
(2) පල්ලව යුගයයි.
(3) සංගමරුවීය යුගයයි.
(4) යුරෝපීයයන්ගේ යුගයයි.

**8.** අදහස් ප්‍රකාශ කිරීමෙන් තොරව ජතිවලට නැටීම,
(1) නිරුත්තම් ය. (2) නිරුත්තියම් ය. (3) නාට්ටියම් ය. (4) නාට්‍ය ය.

**9.** ඔබ උගත් ශබ්දයේ පළමු කණ්ඩිකයි පිහිටා ඇති රාගය වනුයේ,
(1) ෂන්මුගප්‍රියා ය. (2) මධ්‍යමාවතී ය. (3) නාට්ටයි කුරින්ජි ය. (4) කාම්බෝදි ය.

**10.** මුල් කාලයේ කුත්තු රඟ දැක්වූයේ,
(1) එළිමහන් රංග ශාලාවල ය.
(2) චිත්‍රපට ශාලාවල ය.
(3) වෘත්තාකාර රංග ශාලාවල ය.
(4) හතරැස් රංග ශාලාවල ය.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**11.** සිංහල නැටුම්වල 'සුරල්' යන සුවිශේෂ අංගය ඇතුළත් නැටුම් වර්ගය,
(1) සබරගමු නැටුම් ය. (2) රුහුණු නැටුම් ය. (3) උඩරට නැටුම් ය. (4) ගැමි නැටුම් ය.

**12.** ඔට්ටක්කුත්තර් නිර්මාණය කරන ලද 'තක්කයාහපරණි' යන ශෛලිගත නාට්‍ය (නාට්ටිය නාඩගම) රඟපාන ලද්දේ,
(1) පල්ලව යුගයේ දී ය. (2) චෝළ යුගයේ දී ය. (3) පාණ්ඩිය යුගයේ දී ය. (4) සංග යුගයේ දී ය.

**13.** වෘත්තීය නැටුමට අදාළ ගීය,
(1) "කුම්මියඩිපෙන්නේ කුම්මියඩි" වේ.
(2) "කෝලාඩුවෝම් නාම් පන්පාඩුවෝම්" වේ.
(3) "කරකම් කරහමඩි මුත්තුමාරි" වේ.
(4) "මලයි ඒරි තලිර් කොයියුම් මාදර් අම්මා නාම්" වේ.

**14.** පංචපාණන්ට අයත් තවත් නමකි,
(1) මන්මදන්. (2) සිවන්. (3) සුබ්‍රමණියන්. (4) රාමන්.

**15.** වසන්තා හෙවත් සාවේරි ජතිස්වරයේ නිර්මාණය සමග එන්නේ,
(1) කෝර්වයි ය. (2) අරුදි ය. (3) ජති ය. (4) මෙයියඩවු ය.

**16.** සුළඟ නිරූපණය කිරීමට වම් හා දකුණු අත්වලින් භාවිත කරන හස්තම් පිළිවෙළින්,
(1) අරාලම් සහ තුගතුණ්ඩම් වේ.
(2) පදාකම් සහ තිරිපදාකම් වේ.
(3) පදාකම් සහ පදාකම් වේ.
(4) තිරිපදාකම් සහ මයුරම් වේ.

**17.** රඟපාන්නා තමා ම ගායනා කරමින් අභිනය දැක්වීම,
(1) සූකිතවාචිකම් ය. (2) උපකීතවාචිකම් ය. (3) සුසප්තවාචිකම් ය. (4) උපසප්තවාචිකම් ය.

**18.** ආලිඩ මණ්ඩල තත්ත්වයේ සිට ආරම්භ වන අඩව්ව,
(1) තට්ටු මෙට්ටඩව්ව ය. (2) නාට්ටඩව්ව ය. (3) කුදිත්තු මෙට්ටඩව්ව ය. (4) මණ්ඩියඩව්ව ය.

**19.** නාට්‍ය කච්චේරි ව්‍යුහයේ කේන්ද්‍රික උරුප්පඩිය වන්නේ,
(1) තිල්ලානා ය. (2) වර්ණම් ය. (3) පදම් ය. (4) ස්ලෝකම් ය.

**20.** සකඩ මුද්‍රාව භාවිත කෙරෙන්නේ කවුරුන් දැක්වීම සඳහා ද?
(1) දේවතාවුන් (2) ඉන්ද්‍ර (3) රාක්ෂයන් (4) ශිව

**21.** තත්,; තෙයි,; තා; හා; ගෙන ඇති අක්ෂර සංඛ්‍යාව,
(1) 8 කි. (2) 14 කි. (3) 16 කි. (4) 32 කි.

**22.** ධනයට අධිපති දෙවියා,
(1) ඉන්ද්‍ර ය. (2) වරුණ ය. (3) කුවේර ය. (4) අග්නි ය.

WWW.OLEVELAPI.COM

**23.** 'තදිංගිනතොම්' යන්නෙහි අඩව් සොට්කට්ටු,
(1) 'තෙයි දිතිතෙයි' වේ.
(2) 'දිතිතෙයි' වේ.
(3) 'තෙයි තෙයි දිතිතෙයි' වේ.
(4) 'දිතිතෙයි දිතිතෙයි' වේ.

**24.** "තාලම් පිඩිත්ත වළක්කයි කබිත්තම්" මගින් නිරූපණය වන අධිදේවතාවිය,
(1) සරස්වතී ය. (2) ලක්ෂ්මී ය. (3) විෂ්ණු ය. (4) ශිව ය.

**25.** ලෝක ධර්මීභාව ප්‍රකාශ කිරීමක් වන්නේ,
(1) අභිනය මුද්‍රාවෙන් දැක්වීම ය.
(2) නටන විට කඳුළු සලමින් රඟපෑම ය.
(3) අඩව් ප්‍රයෝගයෙන් රඟපෑම ය.
(4) ජති සොට්කට්ටු සමග රඟපෑම ය.

**26.** ශබ්දම් යන උරුප්පඩි වර්ගය භරත නාට්‍ය කච්චේරිවල ප්‍රථම වරට හඳුන්වා දුන්නේ,
(1) තංජයි නාල්වර් ය.
(2) මුත්තුත් තාණ්ඩවර් ය.
(3) අරුණාසලම් කවිරායර් ය.
(4) ගෝපාලක්‍රිෂ්ණ බාරදියාර් ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**27.** ආයතම් යන පාද ස්ථාන සහිත ව අතෙහි අර්ධ චන්ද්‍ර මුද්‍රාව සමග නටන නැටුම්,
(1) සබරගමු නැටුම් ය. (2) ග්‍රාමීය නැටුම් ය.
(3) භරත නැටුම් ය. (4) කුත්තුගල් ය.

**28.** 'සිවපාදසේකරන්' යන විරුදාවලිය ලද්දේ,
(1) පළමුවැනි රාජ රාජ චෝළ ය. (2) ඔට්ටක්කුත්තර් ය.
(3) පාණ්ඩ්‍ය රජු ය. (4) රාජ රාජන් ය.

**29.** කලා රංග උත්සවයේ ප්‍රථමයෙන් සිදු විය යුතු අංශය කුමක් ද?
(1) ගුණදොස් දැක්වීමේ කථාව (2) ප්‍රධාන ආරාධිතයාගේ කථාව
(3) ස්තුති කථාව (4) පිළිගැනීමේ කථාව

**30.** රණියන් මැරීම සඳහා ගනු ලැබූ අවතාරය,
(1) වාමණ අවතාරය ය. (2) පලරාම අවතාරය ය.
(3) ක්‍රිෂ්ණ අවතාරය ය. (4) නරසිම්ම අවතාරය ය.

**31.** තිස්ර ජාති අලාරිප්පු හා වසන්තා හෙවත් සාවේරි ජතීස්වරයට පොදු ආරම්භ තීර්මාන අඩව්ව වනුයේ,
(1) තාගත්ත ජෙම්දරි තා අඩව්ව ය. (2) තෙයිහත් තෙයිහි අඩව්ව ය.
(3) දිතිතෙයි දිතිතෙයි අඩව්ව ය. (4) තත්තෙයි තා හා අඩව්ව ය.

**32.** මුදුනෙහි සෙවණැල්ල බිම නොවැටෙන සේ කලාත්මක ලෙස නිර්මාණය කරන ලද කෝවිල,
(1) සිදම්බරම් නාඩරාජර් කෝවිල ය. (2) තංජයි පෙරුවුඩයාර් කෝවිල ය.
(3) තිරුවන්නාමලයි කෝවිල ය. (4) වෛතීස්වරර් කෝවිල ය.

**33.** 'සාහිත්‍ය කර්තා' යනුවෙන් හඳුන්වන්නේ,
(1) ගීය ලියූ අයයි. (2) නට්ටුවනාර් ය.
(3) නැටුම් නිර්මාණය කරන්නා ය. (4) නැටුම් ශිල්පියා ය.

**34.** 'පිඩිල්' යන සංගීත උපකරණය,
(1) වීණාවයි. (2) වයලීනයයි.
(3) තාම්පුරාවයි. (4) ගිටාරයයි.

**35.** ප්‍රේංගණ මණ්ඩලයේ නටන අඩව්ව,
(1) තට්ටඩව්ව ය. (2) තෙයිහත් තෙයිහි ය. (3) තා තෙයි තෙයිත ය. (4) නාට්ටඩව්ව ය.

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

**36.** මුරුගන් දෙවිවරුන්ට අදාළ හස්තය මාරු කර ඇල්ලූ විට ................................ යන නවග්‍රහ හස්තය ලැබේ.
(1) බුධ (2) හිරු (3) සෙනසුරු (4) රාහු

WWW.OLEVELAPI.COM

**37.** නායක නායිකාවන් හා මිතුරියන්ට වැදගත්කමක් ලබා දෙන උරුප්පඩිය ................................ නම් වේ.
(1) තිල්ලානා (2) ජාවලි (3) අලාරිප්පු (4) ජතීස්වරම්

**38.** චෝළ යුගයේ බිහි වූ මහා සාහිත්‍ය අතර ................................ ද එකකි.
(1) කම්බරාමායනය (2) සිලප්පදිකාරම් (3) මණිමේකලයි (4) සීරාප්පුරාණම්

**39.** මකුට අඩව්ව වර්ග ................................ කි.
(1) දෙක (2) තුන (3) හතර (4) පහ

**40.** කල්කි අවතාරය අභිනයෙන් දැක්වීමට ................................ යන පාදභේදම් යොදා ගනී.
(1) ප්‍රේංගණම් (2) ස්වස්තිකම් (3) අශ්වෝත්ප්ලවනම් (4) ආයතම්

**

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....